# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII    MARCH 2023    Issue No. 04


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 66:12-20)**

12. ඔබ මනුෂ්‍යයන් අපේ හිසට උඩින් යැවූසේක, ගිනි මැදදී හා ජල මැදින්ද ගියෙමුව, නුමුත් ඔබ අප එයින් සාරවත් තැනකට පැමිණවූසේක.

13. මම දවන පූජා රැගෙන ඔබගේ ගෘහයට ඇතුල්වෙන්නෙමි, මාගේ විපත්තියේදී මාගේ තොල්වලින් කීවාවූ,

14. මාගේ මුඛයෙන් කථාකලාවූ මාගේ භාර ඔබට ඔප්පුකරමි.

15. බැටළුවන්ගේ සුවඳ දුම් සහිතව, තර සතුන් දවස පූජාවන් කොට ඔබට පුදන්නෙමි, ගොනුන්ද එළුවන්ද සමඟ පූජාකරන්නෙමි.

16. දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇති සියල්ලෙනි, ඇවිත් අසව්, උන්වහන්සේ මාගේ ආත්මය උදෙසා කළ දේ ප්‍රකාශකරන්නෙමි.

17. මාගේ මුඛයෙන් උන්වහන්සේට මොරගැසීමි, මාගේ දිවෙන් උන්වහන්සේ උසස් කරනු ලැබූසේක.

18. අයුතුකම් කිරීමේ අභිප්‍රායක් මාගේ සිතෙහි ඇත්නම්, ස්වාමීන්වහන්සේ මාගේ බස් නාසනසේක.

19. නුමුත් සැබවින්ම දෙවියන්වහන්සේ ඇසූසේක. මාගේ යාච්ඤා ශබ්දයට කන්දුන්සේක.

20. මාගේ යාච්ඤාවද මා කෙරෙන් තමන් කරුණාවද පහ නොකළාවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.

## "නුඹලාගේ ශෝකය ප්‍රීතියට හැරෙන්නේය..."

(ගීතාවලිය 16:20)

(පාස්ටර් සැම් සෙල්ව රාජ් ප්‍රධාන සභාවේ බෙදාගත් පණිවිඩයකි)

**YOUR SORROW WILL BE TURNED INTO JOY!**

ඔබගේ ශෝකය සතුටට හැරෙන්නේය. ඔබගේ දුක කඳුළු පහ යනු ඇත. කලකිරෙන්න එපා පුතේ, කලබලවෙන්න එපා පුතේ, අප යේසුස් ඔබව අත් නොහරයි.

1. පසුගිය දේ ගැන සිතමින් එපා කලකිරෙන්න, අතීතයේ සිදුවූ දේ අමතක කරන්න, දෙවිඳුන් අලුත් දෙයක් කරනු ඇත. අද දින ඔබ දකිනු ඇත. අද දින ඔබ අධෛර්‍යය නොවන්න. අපගේ දෙවි සමිඳුන් ඔබගේ අත නොහරියි.

2. දෙවිඳුන් බිඳුණු හදවත් සුව කරයි. තැළුණාවූ අයට උපකාර කරයි. සියලු තුවාල බඳිනු ලබයි, අපගේ කඳුළු පිසදමයි. ඔව්, එතුමන් ඔබගේ කඳුළු පිසදමයි. කල නොකිරෙන්න, කල නොකිරෙන්න, දෙවිඳුන් ඔබව අත් නොහරියි.

3. ඔබගේ ශක්තියට වඩා ඔබ පරික්ෂාවට ලක් නොකරයි. ඔබට අවශ්‍ය ශක්තිය ගෙන දෙයි. අධෛර්‍යය නොවන්න. කල කිරීමට පත් නොවන්න. එතුමන් ඔබව අත් නොහරියි.

S. J. බර්ක්මන්ස් පියතුමා

**දෙවියන්වහන්සේ ඔබට දෙන දිව්‍යමය පණිවිඩය මෙයයි.**

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

*Christian YouTube Channel!*

An opportunity to pray with **Pr. S. Sam Selva Raj!**

Message, prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**


Every day – 5.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

*from your dearly beloved brother...*

REACHING NATIONS






**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**CHIEF EDITOR**
Angeline Selvakumari Henry, M.A., M.Ed.

**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**
Bro. N. Prakasam, M.A., General Manager

**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran

**EDITOR, PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

**CORE LEADERS**
Bro. K. Puratchivendan
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah

**E.mail ID**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**
Echo of His Call

# කැඳවීමේ ප්‍රතිරාවය

"... ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය, මට හිඟයක් නොවන්නේය..." (ගීතාවලිය 23:1)

**අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමනීය නාමයෙන් අප ඔබට සුභ පතමි,**

අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තුළින් ආශිර්වාදය ලැබුවාවූ සියලුම දෙනා උදෙසා අප දෙවියන්වහන්සේට ස්තුති කරමු. අපගේ YouTube නාලිකාව හරහා සෑම දිනකදීම විනාඩි 5 ක දේව පණිවිඩයක් බෙදාගන්නා අතර ඒ තුළින් ආශිර්වාදය ලැබුවාවූ බොහෝ දෙනා උදෙසා අප දෙවියන්වහන්සේට ස්තුති කරමු.

දිනපතාම ස්වාමීන්වහන්සේගේ සේවය වර්ධනය වන විටදී සෙනඟද ආශිර්වාදය ලබයි. නමුත් මුල් සභාව තුල සිටි අපෝස්තුලුවරු අත්දැක්කාවූ අමාරුකම් හා පීඩාවන් අපද අත්දකිමු. ශුභාරංචිය තුළින් අපගේ විවිධාකාර වූ සේවාවන් තුළින් යක්ෂයාගේ බලකොටු අප විනාශ කරන විටදී යක්ෂයාට එය දරාගැනීමට නොහැකි නිසා ඔහු අපට පහර දෙනවා ඇත.

නමුත් අප අධෛර්‍යයට පත්වන්නේ නැත. මුල් කාලයේදී අපෝස්තුලුවරුන් විසින් සහ අපගේ මුල් පියවරු විසින් දේශනා කලාවූ එම ප්‍රතිපත්ති අපද නොසැලී දේශනා කල යුතුයි. අප උදෙසා යාච්ඤාකරන මෙන් ඔබගෙන් ඉල්ලමු. හැකි ඕනෑම ආකාරයකින් ඔබගේ උදවු උපකාරයන් ලබා ගැනීමට අප කැමැත්තෙන් සිටිමු. ඔබගේ සහයෝගය, සහභාගීත්වය හා උපකාරය අපට අවශ්‍ය වෙයි.

මෙම මාසයේදී හා පැමිණෙන්නට තිබෙන්නාවූ මාසයේදීත් සේවය සඳහා ගමන් කිරීමට තිබේ. ඔබගේ යාච්ඤාවෙන් අපව දරාගන්න. ඉතා ඕනෑකමින් කැපවීමෙන් යුතුව ආත්ම බරක් ඇතිව මනුෂ්‍යයන්ව දිනාගන්නා පිණිස කරන්නාවූ සේවය ඉතා අමාරුව තිබේ. අපගේ කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ සේවය කරන බොහෝ අයගේ පවුල් වල අය විවිධාකාර රෝග වලින් පෙලෙයි. නමුත් ඔබගේ යාච්ඤාව සහ ප්‍රේමය කරණකොටගෙන අපව සනසතු ලබයි.

ඔබගේ යෝජනාවන් සහ අවශ්‍යතාවයන් ලිපි මාර්ගයෙන් අප වෙතට එවන්න. අප ඔබ උදෙසා යාච්ඤා කරමු. ඔබගේ සියලුම යාච්ඤා ඉල්ලීම් දෙවියන්වහන්සේ වෙතට ගෙන යමින් ඔබ උදෙසාද අපි යාච්ඤා කරමු. දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප ඔබට ප්‍රේම කරමු. අප උදෙසා දීමනාවන් සහ සම්මාදම් වලින් උපකාර කරන්නාවූ සෑම දෙනාටම දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමු...

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✿ BIBLECOR - Postal Courses (3 languages) ✿ Media Ministry ✿ Online Courses ✿ Theological Correspondence Courses (2 languages) ✿ Church Planting ✿ Nehemiah Bible Colleges ✿ Gospel Printing Press ✿ Great Commission Partners ✿ St. Paul's Matriculation School ✿ Crusades ✿ Community Development

*1 පිටුවෙන්....*

පසුගිය දින කීපයක් තුළදී දේශයෙහි සිටින්නාවූ විවිධාකාරවූ පුද්ගලයින්ව මා හට මුණගැසුනි, ඔවුන් අතරින් ප්‍රසිද්ධ වෛද්‍යවරු, බලවත් දේශපාලකයින්, උසස් නිළධාරීන්, කර්මාන්ත ශාලා අයිතිකරුවන්, පොහොසත් අය මෙන්ම මධ්‍යම සහ අධ්‍යාපන මට්ටම පහත්ව සිටින්නාවූ අයව මා හට හමුවිය. එසේම දෙවියන්වහන්සේට භය වෙන්නාවූ අය දෙවි කෙනෙක් නැත කියන අය ශිෂ්‍යයන්, විදේශකයින්, වට වන්දනා යන අය, නළු නිලියන් හෝ ලියන්නන්, ඇදහිලිවන්තයින් යන කණ්ඩායමට අයිතිය.

දේව දාසයින්ව මට මුණගැසුනි. මේ සියලු දෙනාටම විවිධාකාරවූ අමාරුකම්, ප්‍රශ්න සටන් තිබුණි. එම නිසා මනුෂ්‍යයෝ දෙවියන්ගේ පිහිට සොයමින් විවිධාකාර ස්ථාන වලට යන බව අපට තේරුම් ගියේය.

සමහර අය ඔවුන් නොදන්නාවූ දේ කරයි. තවත් සමහරු පුණ්‍ය කටයුතු වලට එම ස්ථාන වලට යන පිණිස දිගු කාලයක සිට සූදානම් වෙති. ඔවුන් විවිධ ශුද්ධස්ථාන වලට යාමට පෙර ඔවුන් භාරයක් වෙමින් හෝ යම් කන්නලව්වක් කර පිටත් වෙයි. මේ සියලුදෙනාම ඔවුන්ට නොලැබෙන දේ සොයමින් ගමන් කරයි. සමහරුන්ගේ සංස්කෘතිය මෙය වී ඇත.

මේ ලෝකයේ විවිධාකාර අමාරුකම්, හා ප්‍රශ්න වලට මුහුණදෙන්නාවූ ස්වල්ප පිරිසත් තමාගේ සංස්කෘතික ක්‍රියාවලින් හා පුරුදු වලින් තමාව වෙනස්කර ගෙන දෙවියන්වහන්සේ ගේ රාජ්‍යය ගැන සිතමින් ඒ ගැන බලාපොරොත්තුව තබමින් ඔවුන්ගේ ශුද්ධකමද රැකගෙන ප්‍රීතියෙන් හා සමාදානයෙන් ජීවත් වෙති.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීමේ බලය මෙවැනි සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිතය තුල ක්‍රියා කරයි. සෑම දෙනාම මෙවැනි අත්දැකීම් ලබා ගත යුතුය, කියා මා විශ්වාස කරමි. කිසි දෙයකට වටින්නේ නැති කෙනෙකුගේ ජීවිතයට යේසුස් වහන්සේගේ මළවුන්ගෙන් නැගිටුණාවූ බලය ක්‍රියාත්මක වූ විට ඒ තැනැත්තා, මහත් වටිනාකමකින් යුත් තැනැත්තෙක් ලෙස වෙනස් වෙයි. එසේම මෙම මළවුන්ගෙන් නැගිටීමේ බලය රෝගාතුරු වූ පුද්ගලයෙකුගේ ජීවිතය ස්පර්ශ වූ විට එම රෝගයෙන් ඔහු සුවය ලබයි. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. ***''නැවත නැගිටීමද ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නමුත් ජීවත්වන්නේය.'' (යොහාන් 11:25)*** යම් කිසි පුද්ගලයෙකුගේ ශරීරයෙහි යම් අවයවයක් ක්‍රියාත්මක නොකරන විට එම තැනැත්තා දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කර හැරෙන විට දෙවියන්වහන්සේගේ දිව්‍යමය බලය කරණකොටගෙන ඔහු සුවපත්වී සාමාන්‍ය පුද්ගලයෙක් ලෙසට හැරෙනු ඇත.

## ලාසරුස් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගේ මිත්‍රයෙක් වූ ලාසරෙස් මිය ගිය නමුත් ස්වාමීවූ යේසුස් වහන්සේ ඔහුව මළවුන්ගෙන් නැගිටෙව්වේය. ඔහු පසු කාලයේදී මිය යනු ලැබුයේ ඔහුගේ මහළු වයසේදීය. නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිපත් වී මරණයට පත්වූ නමුත් තුන්වන දින මළවුන්ගෙන් නැගිටුන අතර නැවත උන්වහන්සේ මරණයට පත්වූයේ නැත. අද සමහර පුද්ගලයින්ව දේව අවතාරයෙක්ය පැවසුවත් ඔවුන් හැමෝම මිය යනු ඇත. ඔවුන් මිය ගිය අතර ඔවුන්ගේ ශරීරය භූමදානය කර ඇත. නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සොහොන අදවන තුරු විවෘතව ඇති ඉතිහාස ගත වූ සිදුවීමකි.


**Statement about ownership and other particulars about the Newspaper Echo of His Call (Sinhala) - Form IV (See Rule 8)**

| | | |
|---|---|---|
| 1. Place of Publication | : | **New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005.** |
| 2. Periodicity | : | **Monthly** |
| 3. Printer, Editor, Owner & Publisher | : | **S. Sam Selva Raj** (Same Address) |
| 4. Nationality | : | **Indian** |

I, **S. Sam Selva Raj** hereby declare that the particulars given above are true to the best of my knowledge and belief.

**March 2023** **S. Sam Selva Raj.**




රෝම අධිරාජ්‍යයෙත් දේව මාළිගාවේ නිළධාරිනුත් යේසුස් වහන්සේගේ සොහොන සම්පූර්ණයෙන්ම රැකවල් කරන ලදි. දේව වචනය මෙසේ පවසයි. ***"ඔව්හු ගොස් ගල මුද්‍රාකර, රැකවලුත් ඇතුව, සොහොන් ගෙය සුරක්ෂිත කලෝය."* (මතෙව් 27:66)** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුන්වන දින මළවුන්ගෙන් නැගිටුනේය. ***(මතෙව් 28:1-8)***

මග්දලේන් මරියා සහ අනෙක් මරියා සතියේ පළමුවෙනි දින සොහොන වෙතට පැමිණියාය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගෝලයින් සියලුදෙනා සමඟ වසර 3 ත් 5 ත් අතර කාලයක් ගත කරමින් මරණයට පත්වී දින 3 කින් මළවුන්ගෙන් නැගිටුනේය, කියා පවසනු ලැබුවද ඔවුන්ගෙන් කිසිවෙක් එය ගණනකට නොගෙන තම නිවසෙහිම සිටියේය. ඔවුන්ගේ සැබෑ ප්‍රේමය යේසුස් වහන්සේට දැක්වීමට ඔවුන් අසමත් විය. නමුත් යේසුස් වහන්සේ ඔවුන්ගේ මෙම ක්‍රියාව ගැන කණස්සල්ලට පත් වූයේ නැත. උන්වහන්සේ ඔවුන්ට දර්ශනය වී ඔවුන්ව සනසමින් ඔවුන්ව බලවත් අපෝස්තුළුවරුන් හැටියට මාරු කරමින් ඔවුන්ගේ දුක සතුටට හැරෙව්වේය.

ප්‍රිය මිත්‍රය, කුඩා සැකය, මාංශයේ තෘෂ්ණාවට ඇති ආශාව නිසා ඔබ දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ රසය විඳ තිබුනත් විවිධ අවස්ථාවන් වලදී මෙවැනි කාරණා ඔබව දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ඈත් කිරීමට ඉඩ දෙන්න එපා. ඔබ අධෛර්‍යයට පත් නොවී ඔබගේ වැරදි දෙවියන්වහන්සේට කියාදී උන්වහන්සේ වෙතට එන්න. උන්වහන්සේ ඔබගේ දුක සතුටට හරවන්නේය.

## දෙවියන්වහන්සේගේ දරුවන්ට අවවාදයක්

මගේ පාලකතුමා වන මිය ගිය ජී. සුන්දරම් යමෙක් දෙවියන්වහන්සේ සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවය කරණකොටගෙන උන්වහන්සේගේ ප්‍රීතිය අත්පත් කරගන්නේ කෙසේද? කියා සභාවට ඉගැන්නුවේය.

ඕනෑම දේව දාසයෙක් හෝ ඉවැන්ජලිස්ත වරයෙක් ලෝකයේ ඕනෑම ස්ථානයකට ගොස් ස්වාමීන්වහන්සේගේ සේවයෙහි නොකඩවාම යෙදීමට හැකිය. නමුත් දෙවියන්වහන්සේ ඔවුන්ට දුන් සභාවත් සමඟ ලණුවක් ගැටගසා එහි අනෙක් කෙළවර තමාගේ ඉගටිය වටා බැඳගැනීම අවශ්‍යයි කියාත් අපගේ සම්බන්ධතාවය සම සහභාගීත්වය කෙසේ තිබිය යුතුද කියාත් ඔහු ඉගැන්නුවේය. ඔබට කුමන වැඩ රාජකාරී තිබුණත් ඉරුදින නමස්කාර මෙහෙයට ගොස් දෙවියන්වහන්සේගේ සෙනඟ සමඟ නමස්කාර කල යුතුමයි. එලෙසම දේව වචනයෙන් පෝෂණය ලබා ගත යුතුමයි.

දෙවනුව අප සෑම දෙනාම පාපිෂ්ඨ පුරුදු හා සිතිවිලි වලින්, වැරදි සම්බන්ධතා තුල සිටියදී උන්වහන්සේගේ මහත්වූ කරුණාවෙන් අප නිදහස ලබා ගත්තද අප නැවතත් පාපිෂ්ඨ ජීවිතයට ගමන් නොකල යුතුයි. යන උපදෙස මා ඔබට දීමට කැමතියි. අප අතහැරිය දේ අපට පහරදීමටත් දෙවියන්වහන්සේගෙන් අපව ඈත් කිරීමටත් බලා සිටින බව දැනගෙන අප ක්‍රියා කල යුතුය.

උදාහරණයක් ලෙස ඔබ කිසියම් පුරුද්දකට ඇබ්බැහි වී සිටී නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව කරණකොට ගෙන ඔබ නිදහස ලැබුවේ නම්, ඔබට ලැබුණු නිදහස ඔබ ඉතාම ප්‍රවේශමෙන් ආරක්ෂා කල යුතුයි. ඔබ පෙරදී එවැනි ස්ථාන වල සිටියා නම්, දැන් ඔබ එවැනි ස්ථාන වලට යෑමෙන් වැලකී සිටිය යුතුයි. ඔබගේ නරක මිතුරන් හා ඔවුන් සමඟ තිබුණාවූ සම්බන්ධතාවයන් තුළින් ඔබ මුලුමුනින්ම ගැලවී ඔබ ඔබවම ආරක්ෂා කරගත යුතුයි. එවිට ඔබට සම්පූර්ණයෙන්ම ජයග්‍රහනය හා ප්‍රීතිය අත්පත් කරගැනීමට පුළුවනි.

*6 වෙනි පිටුවට....*

**Pray for NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
**Certificate in Theology : One year**
**Diploma in Theology : Two years**
Qualification : 10th Standard & above
**Rush for admission!**
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මාර්:19-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහල සහ දේව ධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:20-** ජනවාරි 16 දින පවත්වන ලද දේව සේවක රැස්වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මර්:21-** කැඳවීමේ ප්‍රතිරාවය YouTube සමාජ ජාලයට අලුතින් සම්බන්ධ වන අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:22**- සභාවේ සියලුම සේවකයන් මත දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:23**- සභාවේ දරුවන් සහ තරුණ තරුණියන් තුළ බලවත් ශුද්ධාත්ම පිබිදීමක් අත්දකින බැවින් ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:24**- හුදෙකලා ප්‍රදේශවල සේවය කරන මිෂනාරිවරුන්ගේ ආරක්ෂාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:25**- පාස්ටර් සැම් සෙල්වරාජ්ගේ දේශීය සහ විදේශීය සේවා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:26**- යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු නෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අය ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:27**- වර්ෂ 1969 සිට පවත්වා ගෙන එන කැඳවීමේ ප්‍රතිරාවය පුවත් පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:28**- කැඳවීමේ ප්‍රතිරාවය මුද්‍රණාලයේ සේවකයන් සහ එහි නිසි කළමණාකරණය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:29**- කැඳවීමේ ප්‍රතිරාවය පුවත් පත් සේවයේ සහකාර කතෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වල අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:30**- මිෂනාරිවරුන්ගේ සේවය සඳහා මූල්‍යමය උපකාර කිරීමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මාර්:31**- බයිබල් සහ ක්‍රිස්තියානි පොත්පත් මුද්‍රණය සඳහා මනුෂ්‍යයන් කැපවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**2023 අප්‍රේල් මාසය**

**අප්‍රේ:01-** දේව සේවයේ අවශ්‍යතා සැපයීම ගැන උනන්දුවක් දක්වන අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:02-** පාස්ටර් සැම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු දුෂ්ට බලවේග වලින් ආරක්ෂා වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:03-** නිවැරදි ක්‍රිස්තියානි මූලධර්ම අනුගමනය කරන මිෂනාරි පාසල් ආරම්භ කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අප්‍රේ:04-** ලෝකයේ සෑම රටකම තිබෙන කිතුණු දේවස්ථාන තුල බලවත් ශුද්ධාත්ම පිබිදීමක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:05-** බලාපොරොත්තු රහිත ස්වභාවික විපත් සිදුනොවන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:06-** කිතුණු ඇදහිලිවතුන්ගේ සුබසාධනය ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ:07-** මහ සිකුරාදා සහ පාස්කු ඉරුදින දේව මෙහෙයන් ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ:08-** නෙහෙමියා බයිබල් විදුහල තුළ ඉගෙනුම ලබන අයගේ විනය පිළිබඳව යාච්ඤා කරන්න.

**අප්‍රේ:09-** තරුණ තරුණියන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමට එරෙහිව යාච්ඤා කරන්න.

**අප්‍රේ:10-** තරුණ තරුණියන් වෙනත් නරක පුරුදු වලට හසුවීමට එරෙහිව යාච්ඤා කරන්න.

**අප්‍රේ:11-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ සිසුන් රජයේ විභාගවලට සාර්ථකව මුහුණ දීමට පුළුවන් වන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:12-** දරුවන් ලිංගික අපයෝජන සඳහා ජාවාරම් කිරීමට එරෙහිව යාච්ඤා කරන්න.

**අප්‍රේ:13-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට 2023-2024 වර්ෂ සඳහා නවක සිසුන් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:14-** ජූනි 03 වන දින පැවැත්වීමට නියමිත නෙහෙමියා විදුහලේ උපාධි ප්‍රදානෝත්සවය ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ:15-** සභාවේ සියලුම මූල්‍යමය අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ:16-** නෙහෙමියා බයිබල් විදුහලට 2023-2024 වර්ෂ සඳහා නවක සිසුන් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:17-** පාස්ටර් සැම් සෙල්වරාජ්ගේ නව සේවා දර්ශනය ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ:18-** ලෝකයේ සෑම රටකම ජනාධිපති අගමැති කථානායක නිල වල සිටින අය ගැන යාච්ඤා කරන්න.

*4 පිටුවෙන්....*

## මග්දලේන් මරියා සහ අනෙක් මරියා



මග්දලේන් මරියා යක්ෂ ආත්ම 7 ක් වැසී සිටි කාන්තාවක් වූ අතර යේසුස් වහන්සේ ඇයව එම යක්ෂ ආත්මයන්ගෙන් නිදහස් කරනු ලැබීය. ඇය අනෙක් මරියා සමඟ යේසුස් වහන්සේගේ ශරීරය තැම්පත් කර තිබූ සොහොන ළඟට පැමිණියේය. එම වේලාවේදී භූමිකම්පාවක් ඇතිවී දේව දූතයෙක් ස්වර්ගයෙන් පැමිණ සොහොන වසා තිබූ ගල පෙරලා, ඒ මත වාඩි විය. ***(මතෙව් 28:2)*** සහෝදරයා සහෝදරිය, කිසිවෙකුට පෙරළා දැමීමට නොහැකි විශාල බාධාවක් වැනි ගලක් ඔබගේ ජීවිතයේ තිබෙන්නට පුළුවනි. එය ඉවත් කිරීමට කිසිවෙකුට නොහැකි වීමට පුළුවනි. නමුත් භිය නොවන්න. මාර්ගයක් නොමැති ස්ථානයක දෙවියන්වහන්සේ මාර්ගයක් විවෘත කරයි. ඔබව ආරක්ෂා කිරීමට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දූතයින්ට අණ කරයි. දේව දූතයින් ඔබ උදෙසා වැඩ කරයි. ඔබගේ ආශිර්වාදයන්ට බාධා කරන්නාවූ සියලුම ගල් ඉවත් කරන්නය කියා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දූතයින්ට අණ කරයි. දේව දූතයින් එම බාධාව ඉවත් කර ඒ මත වාඩි වී සිටියි. එම නිසා දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ කරා පැමිණෙයි. ඔබගේ දුක සතුටට හැරෙයි.



## අපගේ වැරදි ප්‍රතිපත්ති

දෙවියන්වහන්සේ ගේ දරුවෙනි, ඔබ ඉතාම ප්‍රවේශම් වන්න. කෙතරම් බාධාවන් ඔබ කරා පැමිණුනත් අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඒ සියල්ලම ඉවතට දැමීමට බලවත්ය. මිනිස් සංහතියටම ආශිර්වාදය ලබා දීමට හැකි යතුරක් මේ ලෝකයෙහි කිසිම මනුෂ්‍යයෙක් සතුව නොමැත. එම යතුර තිබෙන්නේ අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ ළඟය. ඔබගේ සැම වේදනා ස්වාමීවු යේසුස්වහන්සේ වෙත තබන්න. අප උන්වහන්සේගෙන් ඈත්වන්නේ නම් අපට දුක හා වේදනාව බොහෝ ලෙස පැමිණෙයි. සමහරු ඔවුන්ගේ සේවයේ සහ දෙවියන්වහන්සේ සමඟ ගමන් කලාවූ ජීවිතයෙන් පසුබට වී ඇත. මෙය විශාල වරදකි. පාළු වලට සිට දිළිඳුකමෙන් උන්වහන්සේ ඔබව ඔසවා



ඉහළ ස්ථාන වල තබා තිබෙනවා, එසේනම් ඔබ දෙවියන්වහන්සේව අමතක කරන්නේ කෙසේද? ඔබ කල වරද නැවතත් කරන්න එපා. පසුතැවිලි වෙන්න. ඔබගේ දුක ප්‍රීතියට හැරෙන්නේය.

## නැතිවූ දේ සොයන්නාවූ ස්වාමීන්වහන්සේ,

යේසුස් වහන්සේ තුන්වන දින මළවුන්ගෙන් නැගිට්ට සේක. නමුත් උන්වහන්සේගේ ගෝලයින් ඔවුන්ගේ පරණ රැකියාවන්ට ගියේය. සමහරු මසුන් ඇල්ලීමට ගියේය. නමුත් ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය ඔවුන්ට දැක්විය. සමහර ගෝලයින් තිබේරියස් නම් මුහුදු ප්‍රදේශයට මසුන් ඇල්ලීම සඳහා ගියේය. යේසුස් වහන්සේ එම ස්ථානයට ගොස්, ''දරුවෙනි කන්න යම් ආහාරයක් තිබේද?'' කියා ඇසුවේය.



ගෝලයින් ඔවුන්ගේ මුළු ශක්තියම පාවිච්චි කරනු ලැබුවත් කිසිම මාළුවෙක් ඔවුන්ට අල්ලා ගැනීමට බැරිවිය. සේවය කිරීම සඳහා පැමිණි අය ටික කාලයක් සේවයෙහි නිරතවුවත් පසු කාලයේදී එම සේවය අත්හරමින් ඒ සඳහා නිදහසට කාරණා පවසමින් ලෝකයේ විවිධ රැකියාවන් වල නියුතු වන ආකාරයක් මා දැක තිබේ. නමුත් ඔවුන්ගේ අවසානය දුක් සහිතය. මේ වරද කිසිවෙක් කරන්න එපා. මසුන් නොමැතිව බෝට්ටුවේ සිටි ගෝලයින්ට මසුන් ඇල්ලිය යුත්තේ කොහොමද කියා යේසුස් වහන්සේ සමහර කාරණාවන් පැවසුවේය. උන්වහන්සේ සියල්ල දන්නාවූ බලසම්පන්න වූ ගැලවුම්කරුවෙකි. උන්වහන්සේ ඔබව තෝරාගෙන තිබේ. ඔබට තලෙන්ත හා දීමනා දෙමින් ඔබව උසස් කර තිබේ. ඔබගේ යාච්ඤාව කරණකොටගෙන කොපමණ යක්ෂ ආත්ම දුරුකර තිබේද? නමුත් ඔබ මේ සියල්ලම අමතක කර දමා ඔබගේ යම් යම් ප්‍රශ්න නිසා, ඔබට අවශ්‍ය ප්‍රීතිය ලබා ගැනීම පිණිස ඔබ දේවප්‍රේමය අත්හැර දමා යන්නේ කෙසේද? ඔබ නැතිව සිටී නම් දෙවියන්වහන්සේ ඔබව සොයනවා ඇත.

## ඔබගේ ජීවිතය ගැන මොහොතක් සිතන්න.

ඔබගේ ජීවිතයේත් ඔබගේ දරුවන්ගේ ජීවිතයේත් ප්‍රශ්න හා කරදර පැමිණි විට දෙවියන්වහන්සේ ඔබව මුදවාගත්තේ කෙසේද? ඔබ රෝගාතුරුවූ විට ඔබ පරාජයට පත්වූ විට හා ඔබගේ අමාරුකම් වලදී දෙවියන්වහන්සේ ඔබව මුදාගත් ආකාරය ගැන මොහොතක් සිතන්න. දෙවියන්වහන්සේ ඔබ සමඟ සිටිමින් ඔබට දයාව හා කරුණාව දැක්වූයේ නැද්ද? උන්වහන්සේගෙන් උදවු ලබා ගත්තා නම් උන්වහන්සේව අමතක නොකරන්න. ඔබගේ ජීවිතය තුල උන්වහන්සේට ප්‍රථම ස්ථානය ලබා දෙන්න. එවිට ඔබගේ දුක සතුටට හැරෙනු ඇත.

අපගේ ජීවිතයෙහි බොහෝ කුණාටු වලට අප මුහුණ දෙමු. එවැනි කුණාටු බොහෝ පැතිකඩ වලින් විවිධාකාර මිනිසුන් හරහා ඉතා සීඝ්‍රයෙන් අප කරා පැමිණෙයි. නමුත් මේ සියල්ලේදී දෙවියන්වහන්සේගේ බලය කරණකොට ගෙන අප ජයග්‍රහණය ලබන්නේ කෙසේද කියා සිතමු. යම් යම් දේ දරුණු අතට හැරීමට පෙර අප ක්‍රියා කල යුතුය. අප මුහුණ දෙනු ලබන ප්‍රශ්න වලදීත් අපට ඇතිවෙන්නාවූ කුණාටු අතරේදීත් කුඩා ඉවක් අපට තිබේ. ඒ ඉඩකඩ අප පාවිච්චි කරමු. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කරුණාව සෑම අවස්ථාවේදීම අපට වගුරවන්න සූදානම්ව සිටී.

අපගේ සෑම ගැටළුවකටම ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කිරීමට උන්වහන්සේ අපට උපකාර කරයි. මනුෂ්‍යයන් තුළින් අප වෙතට පැමිණෙන ප්‍රශ්න හා

10 වෙනි පිටුවට....



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

"...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

# දිව්‍යමය එළිදරව්වීම

## DIVINE VISITATION!

1971 වන වර්ෂයේදී ස්වාමීන්වහන්සේගේ කරුණාව කරණකොටගෙන චේපාක් චෙන්නෙයි යන පලාතෙහි ජීවත්වෙන්නාවූ කිතුනු නොවන අය ගැන යේසුස් වහන්සේ මගේ හදවතට බරක් ගෙන දුන්නේය. මෙම පලාතෙහි ජීවත් වූ අය ඉතා යහපත් මිනිසුන් වූ අතර ඔවුන්ට දෙවියන්වහන්සේ ගැන ඇදහිල්ලක්ද තිබුණි. ඔවුන් රෑ දහවල් වැඩ කරන ඉතාම කඩිසරවූ සෙනගකි. චේපාක් යන පලාතෙහි බොහෝ සිනමාහල් ප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩාංගන, පොලිස් ස්ථාන, ලෝකයේ දිගම මුහුදු තීරය වූ අලංකාර මරිනා මුහුද තීරය, අන්නාසාලෙයි ප්‍රදීපාගාරය, රජයේ ප්‍රධාන ලේකම් කාර්යාලය, එක්මෝ නැමති ප්‍රධාන දුම්රිය ස්ථානය, සහ මධ්‍යම දුම්රිය ස්ථානය, බොහෝ රාජ්‍ය ආයතන, කෝවම් ගංගාව, ඉතා ප්‍රසිද්ධ සංකෝම් දේවස්ථානය, ජනාධිපති විදුහල, අන්නා ස්මාරකය ආදී බොහෝ ප්‍රසිද්ධ ස්ථානයන් මෙහි තිබේ. මේවා චෙන්නෙයි නුවර ඉතා ප්‍රධාන ස්ථානයි. මෙම ස්ථානයෙහි සිටින දුප්පත්, පොහොසත්, උගත්, නූගත්, යන සියලු දෙනා ගැන මගේ හදවතෙහි විශාල බරක් තිබුණි.

මම සෑම දිනකම මගේ සහකාර සේවකයින් දෙදෙනෙකු සමඟ එනම්, සහෝදර චන්ද්‍රසිං සහ මෝසෙස් පාක්කියමනි යන අය සමඟ රාත්‍රී 8 සිට 10 දක්වා යාච්ඤා කරනු ලැබුවෙමි. අද මේ දෙදෙනාම ඉතාම ප්‍රසිද්ධ ව්‍යාපාරිකයන්ය. අප තිදෙනාම මහත්මා ගාන්ධි පිළිරුව පිටුපස සිට දණ ගසා යාච්ඤා කලෙමි. තවද චිත්‍රපට ශාලාවන් වෙත බොහෝ අයව ඇදගන්නා නිසා මේ පලාතෙහි මේවා වැසී යන්න ඕනිය කියා අප නිතරම යාච්ඤා කලේය.

අපගේ යාච්ඤාවන්ට පිළිතුරු ලෙස පෙරගන්, ස්ටාර් එල්පින්ස්ටන්, දේවි, ශාන්ති, අන්නා, චිත්‍රා, ආදී සෑම සිනමාහලක්ම සිතාගත නොහැකි ආශ්චර්යයක් ලෙස වසා දමනු ලැබීය. එබැවින් මෙවැනි චිත්‍රපට බලා කාමිජ්ඨ ලෙස ජීවිත ගතකලාවූ බොහෝ දෙනා යේසුස් වහන්සේව පිළිගෙන පිරිසිදු වූ ජීවිත ගත කිරීමට හැකියාව ලැබුණි. නමුත් ගැලවීම ලැබූ සෙනගට යන පිණිස මෙම පලාතෙහි සභාවක් නොතිබුණි. මෙම පලාතෙහි සභාවක් රෝපණය කිරීම ඉතාම අපහසුය කියා අප සිතුවෙමු. 1980 වැනි වර්ෂයේදී ඉන්දියාවේ චේපාක් යන ස්ථානයෙහි දෙවියන්වහන්සේගේ සභාවක් ආරම්භ කිරීමට උන්වහන්සේ අපට උපකාර කලේය. නමුත් ඉරුදිනදී අසල්වැසි කිසිවෙක් නමස්කාර කිරීම පිණිස මෙහි පැමිණුනේ නැත. මමත් මගේ බිරිඳත් හා එවකට අත දරුවෙක්ව සිටි මගේ දියණියත් පමණක් එහි නමස්කාර කරනු ලැබුවේය. මේ ආකාරයට වසර 5 ක් ගෙවී ගියේය. අපට බොහෝ විරුද්ධතාවයන් වලට මුහුණ දීමට සිදුවිය.

දිනක් දේව මෙහෙය ආරම්භ කිරීමට පෙර උදෑසන 8.00 ට මා සභාව තිබෙන්නාවූ ස්ථානය පවිත්‍ර කෙරුවෙමි. දේව මෙහෙය ආරම්භ කිරීමට ආසන්නව තිබෙන විටදී එම දේව මෙහෙයට කිසි කෙනෙක් නොපැමිණි නිසා මගේ හදවතට මහත්වූ කලකිරීමක් දැනුනි. ඒ නිසා මා මගේ කාමරයට ගොස් විවේක කාලයක් ගත කරන්න ඕනය කියා ගොස් ඇස් වසා නිදාගැනීමට සූදානම් වුවත් මා හට නින්ද ගියේ නැත. මා මගේ ඇස් දෙක වැසූ විට මා සිහිනයක් දුටුවෙමි.

මා දුටු සිහිනය නම්, මාගේ මුළු නිවසම දීප්තිමත් විදුලි පහන් වලින් ආලෝකමත් වී තිබුණි. නිවස තුළින් ඉතාම මිහිරිවූ සුවඳක් හමන්නට විය.



*Rev. Dr. Bevin Lawrence & Mrs. Serena Bevin*

වයස අවුරුදු 50 ක පමණ පුද්ගලයෙක් මා දේව මෙහෙය පවත්වන්නාවූ ස්ථානයට ඇතුල් විය. ඔහු එහි පැමිණ සියලු විදුලි පංකා සහ විදුලි පහන්වල ස්විච්ය දැමුවේය. ඉන්පසු ඔහු දණගසා නිහඬව යාච්ඤා කලේය. එම මුළු ශාලාවම සෙනඟගෙන් පිරෙන ආකාරය මා දුටුවෙමි.

මා ක්ෂණිකවම නැගිට මගේ භාර්යාවට කථා කොට මගේ දරුවාද සමඟ දේවස්ථානය ඇතුලට ගොස් යාච්ඤා කලෙමු. නමුත් මා දුටු මනුෂ්‍යයා එහි සිටියේ නැත. මා හා මගේ භාර්යාව එදින දේව මෙහෙය නොපැවැත්වීම නිසා දෙවියන්වහන්සේගෙන් සමාව ඉල්ලුවෙමි.

ඊට විනාඩි කීපයකට පසු සුළු ඇඳගත් සහෝදරයෙක් හා ඔහුගේ භාර්යාවද ඔවුන්ගේ පුතාද සමඟ පැමිණ අප සමඟ යාච්ඤා කලෝය. එම සහෝදරයා නම් ඩොක්ටර් බෙවින් ලෝරන්ස්ය.

අද ඔහු දේවගැතිවරයෙක් ලෙස බොහෝ සේවාවන් වල නිරත වෙයි. ඔහුගේ සේවා මූලස්ථානය කොඩෙයිකානම් හි පිහිටා ඇත. ඔහු අද බිෂොප්වරයෙකි. ඔහුගේ බිරිඳ ශෙරිනා බෙවින්ය. අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ ප්‍රධාන සහකාර කතුවරයෙක් ලෙස සේවය කරනු ලබයි. ඔවුන් එකතු වී මහත් වූ සේවයක් කරමින් සිටී.

එදා සිට සෑම ඉරුදිනකදීම සභාවේ දේව මෙහෙය නියමිත වේලාවටම ආරම්භ කලෙමු. එයට සෙනඟ පැමිණුනත් නැතත් අප දේව මෙහෙය දිගටම පවත්වාගෙන හා බයිබල් විදුහලේ ඉගෙනුම ලබන්නාවූ සියලුම දරුවන්ට මා අදත් උගන්වමි. දෙවියන්වහන්සේ සැමදාම යහපත්ය...

************

# විශේෂ දැන්වීමකි.

## ගෞරවනීය නියෝජිතයින් අපට අවශ්‍යයි

මෑතකදී අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව සිංහල, නේපාල්, උර්දු හා ඇෆ්රිකානාස් භාෂාවන් වලින් කියවන්නාවූ පාඨකයින්ගේ අඩුවීමක් දකිමු. සමහ විටදී මෙයට හේතුව වන්නේ අපගේ පරණ මිතුයින් මියගොස් හෝ ඔවුන් ස්ථාන මාරුවීමක් ඇතිවී නිසා වීමට හැකිය. එම නිසා මෙම පාඨකයින්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට අප ඉතා උනන්දුවෙන් කල්පනා කරමින් සිටිමු. එම නිසා අපව නියෝජනය කරන්නාවූ නියෝජිතයින් නේපාලි, උර්දු, සිංහල සහ ඇෆ්රිකානාස් භාෂාවන් වලින් අවශ්‍ය වී තිබේ.

1. වඩා වඩා මේ සඟරාව කියවන්නාවූ සංඛ්‍යාව වැඩි කර ගැනීමට
2. තවත් බොහෝ පිටපත් මුද්‍රණය කර එම නියෝජිතයින් සිටින්නාවූ රටවලට හා පලාත් වලට බෙදා හැරීම.
3. අපගේ නියෝජිතයින් විසින් අලුත් අයගේ නම් සහ ලිපිනයන් සොයමින් ඒ අයට සහ ඔවුන්ගේ පවුල්වල ඥාතීන් හට මෙම සඟරාවේ පිටපත් මුද්‍රණය කර ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.

RNI NO. TN/SIH/2006/17846

7 පිටුවෙන්....




කරදර වලට කුණාටු කියා මා පැවසීමට කැමතියි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් මේ සෑම දේටම අප රැකවරණය ලබාගත්තේ නම්, මේ සියලුම කුණාටු වලින් අපට මිදීමක් ඇත. යේසුස් වහන්සේ යොහාන් 9:4 හි රාත්‍රිය පැමිණීමක් ගැන කථා කරනු ලබන්නේ මේ නිසාය. උන්වහන්සේගේ ක්‍රියාව අප තුල සම්පූර්ණ කිරීමට උන්වහන්සේ කැමැතිය. එය උන්වහන්සේ ඉටු කලේය. නමුත් යක්ෂයා අපව ගිල්වන පිණිස බලා සිටී. (1 පේත්‍රුස් 5:8) ඔබගේ අභියෝග වලට ඔබ මුහුණ දෙන්න. ඒ සෑම අභියෝගයක්ම දෙවියන්වහන්සේ සම්පූර්ණයෙන්ම පාලනය කරන බව විශ්වාස කරමින් එය අමතක නොකර තබාගන්න. ඔබ කෝප වෙන්න එපා. දුක් වෙන්න එපා. සෑම විටම දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. උන්වහන්සේම මා උදෙසා සිටින බව විශ්වාස කරන්න. ඔබගේ සෑම අවස්ථාවකටම ජයග්‍රහණය දෙනු ලබන්නේ දෙවියන්වහන්සේවයි. ස්වර්ග රාජ්‍යයේ කවුළු අමමින් දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

************

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd MARCH 2023.
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**